**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව - 2019**

**--------------------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**-----------------------------**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 12 (4) හා 8 වගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, කොමිෂන් සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිෂන් සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිෂන් සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිෂන් සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිෂන් සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා කොමිෂන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ කොමිෂන් සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති,

පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි එලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ කොමිෂන් සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ආයතනය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ එලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් “මනාලෙස සැලසුම් කරන ලද” අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් කොමිෂන් සභාව විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ගංවතුර ආපදාවට පත් විශ්වවිද්‍යාල කාර්යමණ්ඩලය වෙනුවෙන් සහනාධාර ලබාදීම සඳහා භාණ්ඩාගාරය විසින් 2011 වර්ෂයේ සිට ලබාදී තිබුණු ගංවතුර සහනාධාර මුදල් වලින් 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය තුළ ආපසු අයකර ගත් රු. 26,566,366 ක් අරමුදල් ගිණුමකට බැර කර තිබුණි. ඒ අනුව එම මුදල අතීතානුයෝගීව ගැලපීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ ආදායමක් ලෙස ගිණුම්ගත කර තිබීම නිසා එම ප්‍රමාණයෙන් වර්ෂයේ ආදායම වැඩියෙන් දක්වා තිබුණි. | 2014 වර්ෂයේ සිට මේ දක්වා ගංවතුර සහනාධාර ලබාදී ආපසු අයකර ගනුලබන මුදල් ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ පුනරාවර්තන වියදම් සඳහා භාවිතා කරන ලද අතර එය ආදායම් සහ වියදම් ගිණුමේ ආදායමක් ලෙස ගෙන නැත. නමුත් 2019 වර්ෂයේ දී එය පුනරාවර්තන ආදායමක් ලෙස ආදායම් ගිණුමට බැර කර ගිණුම් සටහන් නිවැරදි කරන ලදී. | කොමිෂන් සභාවේ ආදායම් ප්‍රකාශය පිළියෙළ කිරීමේදී කාල පරිච්ඡේදයට අදාළ ආදායම පමණක් සැලකිල්ලට ගත යුතුය. |
| (ii) | සමාලෝචිත වර්ෂය තුළ භාණ්ඩාගාරය විසින් ලබා දී තිබූ | වාර්ෂික අයවැය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් | වෙනත් ආයතන වෙත අත්තිකාරම් ලෙස ලබා දී |

| | | |
|---|---|---|
| ප්‍රතිපාදනවලින් එම ප්‍රතිපාදන ලබා දී තිබූ අරමුණින් බැහැරව පශ්චාත් උපාධි ආයතනයක් වෙත ලබා දී තිබුණු රු.මිලියන 2 ක අත්තිකාරම් මුදල්, අයකර ගත යුතු අත්තිකාරම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම වෙනුවට කොමිෂන් සභාවේ වියදමක් ලෙස දක්වා තිබුණි. | සභාවට ලැබෙන සමස්ථ ප්‍රතිපාදන 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 100 (2) වගන්තියට අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට පවතින බලතල ප්‍රකාරව වැය ශීර්ෂ අංක 214 යටතේ අනුමත වූ වාර්ෂික අයවැය ප්‍රතිපාදන තුල මෙම ගෙවීම් සිදුකර ඇත. | ඇති මුදල් වර්ෂය අවසානයේදී පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |

**1.6 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශයේ දක්වා ඇති ලැබිය යුතු රු.895,619 ක් වූ ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | රු.893,271 ක ලැබිය යුතු ශේෂය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ කාර්යන් සඳහා උසස් අධ්‍යාපන පරිශ්‍රයේ සවිකරන ලද වායු සමීකරණ යන්ත්‍රවල වටිනාකම වන අතර එම යන්ත්‍ර විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වෙත ආපසු ලබා ගැනීමට කටයුතු කරගෙන යනු ලැබේ. රු.2,348 ක් වූ ශේෂය මොරටුව විශ්වවිද්‍යාලය වෙත ස්ථාන මාරුවක් ලබා ගිය නිලධාරිනියකගෙන් ලැබිය යුතුව ඇත. | අදාළ ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

**1.6.2 ගෙවිය යුතු ගිණුම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.2,959,883 ක් වූ ශේෂ වර්ෂ ගණනාවක සිට නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | ගෙවිය යුතු ගිණුම් ශේෂයන් සඳහා අදාළ ආයතනයන්හි ද තහවුරු කිරීම් ලබා ගෙන එම ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. | කඩිනමින් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6.3 අත්තිකාරම්**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් විශ්වවිද්‍යාල 03 ක් වෙත පරිගණක මෘදුකාංග ස්ථාපිත කිරීම සඳහා ලබාදී තිබූ රු.10,253,750 ක | මෘදුකාංග පද්ධතිවල පවතින ගැටළු හඳුනාගෙන විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවට නියමිත ආකාරයට යාවත්කාලීන තත්ත්වයට පත්කළ යුතුව ඇත. ලිඛිතව දැනුම් දී ඇත. මහපොළ ශිෂ්‍යත්ව අරමුදල් සඳහා වූ මෘදුකාංග පද්ධතිය මහපොළ භාරකාර අරමුදල සම්බන්ධ | අදාළ කාර්ය නියමිත පරිදි ඉටුකරවා ගෙන අත්තිකාරම් පියවා ගැනීමට කටයුතු කළ යුතුය. |

අත්තිකාරම් සමාලෝචිත වර්ෂය කරගනිමින් කඩිනමින් නිරාකරණය කිරීමට
අවසාන වනවිටත් පියවා ඉදිරියේ දී කටයුතු සිදු කරනු ඇත.
නොතිබුණි.

**1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ III පරිච්ඡේදයේ 18.1 වගන්තිය | කොමිෂන් සභාවේ දිගුකාලයක සිට ප්‍රධාන තනතුරු 08 ක පැවති පුරප්පාඩු සමාලෝචිත වර්ෂය අවසානය දක්වා පිරවීමට කටයුතු කර නොතිබුණි. | 1978 විශ්වවිද්‍යාල පනතේ 8 වන වගන්තියේ බලතල ප්‍රකාරව අවශ්‍ය සේවක සංඛ්‍යාව බඳවා ගැනීම පිළිබඳව තීරණය කරන අතර ඒ අනුව දැනට විගණන විමසුමේ සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට කටයුතු කර නැත. අවශ්‍යතාවය සලකා බලා ඉදිරියේදී ඒ පිළිබඳ පියවර ගනු ලැබේ. | කොමිෂන් සභාවේ කාර්යයන් කාර්යක්ෂම හා ඵලදායී අයුරින් කරගෙන යාම සඳහා අනුමත සේවක සංඛ්‍යාවට ඇතුළත් පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.12,267,136 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.74,704,144 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.62,437,008 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට හේතු වශයෙන් වෙනත් ආදායම් අඩුවීම සහ වැටුප් වේතන හා කාර්ය මණ්ඩල ප්‍රතිලාභ වියදම වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | දීප ව්‍යාප්ත මට්ටමින් පවත්වනු ලබන අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයට පෙනී සිට ඉහළ Z අගයක් හිමිකර ගෙන ඇති අයදුම්කරුවන් විශ්වවිද්‍යාලයට ඇතුළත් කිරීම සඳහා පවත්වන යෝග්‍යතා පරීක්ෂණ අසමත්වීම හේතුවෙන් අ.පො.ස (උසස් පෙළ) විභාගයෙන් ඉහළ Z අගයකින් සමත් වුවද මනාපය පළ කරන ලද පාඨමාලාවලට ඇතුළත්වීමට හෝ විශ්වවිද්‍යාලයට පිවිසීමට තිබූ | යෝග්‍යතා/ ප්‍රායෝගික පරීක්ෂණ සම්බන්ධයෙන් ඇති විවිධ ගැටළුකාරී තත්ත්වයන් හේතුවෙන් 2019/2020 අධ්‍යයන වර්ෂයේ සිට අ.පො.ස (උ/පෙළ) විභාගයේ ප්‍රතිඵල මත පදනම්ව විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිසුන් තේරීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තීරණය කර තිබුණ ද විවිධ පාර්ශවයන්ගේ දැඩි ඉල්ලීම මත එම පරීක්ෂණ තවත් වසර 02 කට පමණක් පැවැත්වීමට | දීප ව්‍යාප්ත මට්ටමින් පවත්වනු ලබන තරඟකාරී විභාගයේ ප්‍රතිඵල මත විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා සිසුන් ඇතුළත් කර ගැනීම කෙරෙහි කළමනාකරණයේ අවධානය යොමු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | අවස්ථාව අභිමිවන තත්ත්වයක් නිරීක්ෂණය විය. එසේ වුවද තවදුරටත් මෙම ක්‍රමය සංශෝධනය කිරීම හෝ අත්හිටුවීමට කටයුතු කර නොතිබූ අතර 2019/2020 අධ්‍යයන වර්ෂයේදී විශ්වවිද්‍යාලයට සිසුන් ඇතුළත් කිරීමේදී යෝග්‍යතා පරීක්ෂණ පැවැත්වීමේ ක්‍රියාවලිය තවදුරටත් අනුගමනය කිරීමට කටයුතු කර තිබුණි. | කොමිෂන් සභාව විසින් තීරණය කරන ලදී. තවද ඉදිරියේදී හඳුන්වා දෙනු ලබන නව පාඨමාලා සඳහා මෙම පරීක්ෂණ ඇතුළත් නොකිරීමට ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව තීරණය කර ඇත. | |
| (ii) | විශ්වවිද්‍යාලවලට සිසුන් ඇතුළත් කිරීමේ දත්ත අනුව විශ්වවිද්‍යාල 15 ක 2008 වර්ෂයට සාපේක්ෂව 2018 වර්ෂයේදී එනම් වසර 10 ක් තුළ ඇතුළත් කර ගෙන තිබූ ශිෂ්‍ය සංඛ්‍යාව 19,620 සිට 29,863 දක්වා එනම් සියයට 52 ක වැඩිවීමක් නිරීක්ෂණය වුවද පසුගිය වර්ෂ 05 තුළ මූලධන හා පුනරාවර්තන වියදම් සඳහා භාණ්ඩාගාර ප්‍රදාන රු. මිලියන 198,681 ක් හා උපයාගත් අරමුදල් රු.මිලියන 320,645 ක් වැයකර තිබුණි. එහෙත් එක් එක් විශ්වවිද්‍යාලවල පවත්වා ගෙන යනු ලබන පාඨමාලා සඳහා සිසුන් ඇතුළත් කර ගැනීමේ සැලකිය යුතු කාර්යසාධන මට්ටමක් ලඟා කරගෙන නොතිබූ අතර පසුගිය වසර 10 ක විශ්වවිද්‍යාල 03 ක කිසිදු පාඨමාලාවක් හඳුන්වාදීම ද සිදුකර නොතිබුණි. | විශ්වවිද්‍යාලවලට බඳවා ගනු ලබන ප්‍රමාණය සෑම වර්ෂයකදීම වැඩිකිරීමට කටයුතු කරනු අතර ඒ අනුව 2019/2020 අධ්‍යයන වර්ෂය සඳහා බඳවා ගැනීමට යෝජිත ශිෂ්‍ය සංඛ්‍යාව 34,161 දක්වා වැඩි කර ඇති අතර එය පසුගිය වසරට සාපේක්ෂව (31,158) සියයට 9.64 ක පමණ වැඩිවීමකි.<br>නිසි වෙළඳපොළ සමීක්ෂණ සිදුකර විශ්වවිද්‍යාල විසින් නව පාඨමාලා සඳහා වන විෂය ක්ෂේත්‍රයන් හඳුනාගෙන ඊට අදාළ විෂය මාලා සංවර්ධනය කර, අවශ්‍යවන සුදුසුකම්වලින් යුතු ආචාර්යවරුන් බඳවා ගෙන සුදුසු නව පාඨමාලා හඳුන්වාදීම සිදුකළ යුතුවේ. | විශ්වවිද්‍යාල වෙනුවෙන් වාර්ෂිකව වැය කරනු ලබන අරමුදල්වලට සාපේක්ෂව හැකිතාක් දුරට විශ්වවිද්‍යාලවලට ඇතුළත් කර ගනු ලබන ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීමටත් නව පාඨමාලා හඳුන්වාදීමටත් පියවර ගැනීමට කළමනාකරණයේ අවධානය යොමු කළ යුතුය. |
| (iii) | නවක වදය අවම කිරීම සඳහා පිහිටවූ Centre for Gender Equity and Equality අංශය වෙත 2017 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ලැබී තිබූ පැමිණිලි සංඛ්‍යාව වර්ෂයකට 200-250 ක් අතර ප්‍රමාණයක් වුවද අදාළ අංශ වෙත යොමු කර ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග ගෙන ඇති බවක් විගණනයේදී අනාවරණය නොවුණි. එහෙත් එම කාලපරිච්ඡේදය තුළ රු.මිලියන 27 කට ආසන්න මුදලක් මෙම | 2017 සිට මේ දක්වා මෙම කේන්ද්‍රයට ලැබුණු සියලුම පැමිණිලිවලට අදාළ නිසි ක්‍රියාමාර්ග අදාළ නීතිමය රාමුවට අනුකූලව සිදුකර ඇත.<br>2019 අප්‍රේල් මස රට තුළ උද්ගත වූ තත්ත්වය ද සැප්තැම්බර් සහ ඔක්තෝම්බර් මාසවල පැවති විශ්වවිද්‍යාල අනධ්‍යයන සේවක වැඩ වර්ජනය ද යම් යම් අනෙකුත් ප්‍රායෝගික ගැටළු හමුවේ මෙම කේන්ද්‍රයෙහි ක්‍රියාකාරී සැලැස්මෙහි තිබූ ක්‍රියාකාරකම් සම්බන්ධව ස්ත්‍රී | අදාළ අරමුණු හා ඉලක්ක ලඟා කර ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| අංශය වෙනුවෙන් වැය කර තිබුණ ද කාර්යසාධනය ඉතා පහළ මට්ටමක පැවතුණි. | පුරුෂ සමාජභාවයේ සමානතාව/ සාධාරණත්වය පිළිබඳව ස්ථාවර කමිටුවෙහි තීරණවල සිදු වූ වෙනස් වීම් ද හේතුවෙන් සැලසුම් කළ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වූ තත්ත්ව පැවති බව මෙයින් දන්වමි. | |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| පශ්චාත් උපාධි ප්‍රදානලාභීන් නියමිත පරිදි වසර 03 ක් තුළ තම උපාධිය සම්පූර්ණ කළ යුතු වුවත් 2009 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා පශ්චාත් උපාධි ප්‍රදාන ලබාදුන් උපාධි ප්‍රදානලාභීන් 204 දෙනෙකු සඳහා රු.190,367,674 ක් ප්‍රදාන ලබා දී තිබුණ ද පශ්චාත් උපාධි සම්පූර්ණ කළ උපාධිධාරීන් ප්‍රමාණය 119 ක් පමණක් හෙවත් සියයට 58 ක් වැනි අඩු මට්ටමක පැවතුණි. එසේම උපාධිය සම්පූර්ණ කළ බවට සඳහන් කර තිබූ උපාධිධාරීන් 14 දෙනෙකු සහතිකපත් ඉදිරිපත් කර නොතිබූ අතර තම ප්‍රගතිය පිළිබඳ ප්‍රතිචාර නොදැක්වූ උපාධිධාරීන් 04 දෙනෙකු සිටින බව 2009 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා පශ්චාත් උපාධිය සම්පූර්ණ කිරීමේ ප්‍රගතිය පරීක්ෂා කිරීමේදී නිරීක්ෂණය විය. | 2009 වර්ෂයේ සිට 2016 වර්ෂය තෙක් තම උපාධි කටයුතු අවසන් නොකළ ප්‍රදානලාභීන් සඳහා සිහි කැඳවීම් ලිපි නිකුත් කර ඇති අතර එයට යහපත් ප්‍රතිචාර වශයෙන් ප්‍රදානලාභීන් 32 ක් තම පශ්චාත් උපාධි අවසන් කර එම උපාධි සහතික අප වෙත ලබා දීමට කටයුතු කර ඇත. ඉතිරි ප්‍රදානලාභීන් තම පශ්චාත් උපාධි කටයුතු අවසන් කර නිබන්ධන භාර දුන් බවට සහතික කරන ලිපි ඉදිරිපත් කර ඇත. ඒ අනුව 2020.07.15 වන විට ප්‍රදානලාභීන් 119 ප්‍රමාණයක් පශ්චාත් උපාධි සම්පූර්ණ කර ඇත. | ප්‍රදාන මුදල් ලබාගත් පශ්චාත් උපාධි ප්‍රදානලාභීන් අදාළ කාලපරිච්ඡේදය තුළ පාඨමාලා නියමිත පරිදි අවසන් කරන බවට පසුවිපරම් කළ යුතුය. |

### 3.3 අරමුදල් ඌන උපයෝජනය

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | විශ්වවිද්‍යාලවල පාඨමාලා සහ ආයතනික සමාලෝචන කටයුතු වෙනුවෙන් රැස්කර ගෙන තිබූ සමාලෝචිත වර්ෂය අවසාන දිනට කොමිෂන් සභාවේ සංවර්ධන අරමුදලේ පැවති රු.39,129,376 ක් හා ගෙවිය යුතු ලෙස දක්වා ඇති රු.30,583,530 ක ශේෂය සමාලෝචිත වර්ෂය තුළ සමාලෝචන කටයුතු වෙනුවෙන් උපයෝජනය කිරීමට හෝ හෝ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | 2019 වර්ෂය තුළ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් උපයන ලද රු.මිලියන 30.3 ක මුදලක් එම වර්ෂයේ ප්‍රාග්ධන හා පුනරාවර්තන වියදම් සඳහා යොදවන ලද අතර සමාලෝචිත වර්ෂය තුළදී ආදායම් වියදම් ගිණුමේ අතිරික්තයක් පෙන්වනු ලබන බැවින් මෙම වර්ෂය තුළදී සංවර්ධන අරමුදලේ අදාළ අරමුණු සඳහා භාවිතා නොකරන ලදී. එහෙත් කාරක ප්‍රාග්ධන අවශ්‍යතා වෙනුවෙන් භාවිතා කරන ලදී. | සමාලෝචන කටයුතු වෙනුවෙන් ලබාගෙන ඇති අරමුදල්වල පවතින ශේෂයන් අදාළ අරමුණු වෙනුවෙන් උපයෝජනය කිරීමට හෝ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ii) | ත්‍යාග හා ශිෂ්‍යත්ව අරමුදල යටතේ වූ අරමුදල් 12 ක පැවති රු.මිලියන 32.9 කින් යුක්ත වූ ශේෂයන් අතුරින් අරමුදල් 08 ක පැවති රු.මිලියන 30.1 ක් හෙවත් සියයට 91.4 ක් සමාලෝචිත වර්ෂය තුළ අරමුදල පිහිටුවීමේ අරමුණ වූ ශිෂ්‍යත්ව ප්‍රදානය සඳහා උපයෝජනය කර නොතිබුණි. | UGC විවෘත ශිෂ්‍යත්ව අරමුදල (UGC Open Scholarship) සහ විශ්වවිද්‍යාල ශිෂ්‍යත්ව අරමුදල (Universities Scholarship Fund) 2019 වර්ෂයේ දී විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා අරමුදල වෙත මාරු කරන ලදී. | අරමුදල් පිහිටුවීමේ අරමුණු වෙනුවෙන් උපයෝජනය කළ යුතුය. |